**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**University of Sri Jayewardenepura, Sri Lanka**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**External Degrees and Extension Courses Unit (EDECU)**

මගේ අංකය : 
My Number

නුගේගොඩ , ශ්‍රී ලංකාව
Nugegoda , Sri Lanka

ඔබේ අංකය : 
Your Number

දුරකථන : 2801481, 3132496
Telephone

ෆැක්ස් : 2802753

2019.05.21

ප්‍රිය ශිෂ්‍යා/ ශිෂ්‍යාව

**බාහිර උපාධි සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශයේ ලියාපදිංචි ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක වශයෙන් ඔබ සම්මන්ත්‍රණ සඳහා විශ්වවිද්‍යාලයට හෝ විශ්වවිද්‍යාලයෙන් නම් කළ පාසලක් හෝ වෙනත් ආයතනයකට පැමිණෙන විට පවතින ආරක්ෂක තත්වය මත පහත සඳහන් උපදෙස් පිළිපැදීම අනිවාර්ය බව දන්වමි.

1. විශ්වවිද්‍යාලයෙන් ඔබ වෙත ලබා දී ඇති ශිෂ්‍ය වාර්තා පොත අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති කිසිදු ශිෂ්‍යයෙකුට අදාළ පරිශ්‍ර වලට ඇතුළත් වීමට අවසර දෙනු නොලැබේ.
2. අවශ්‍ය ඕනෑම අවස්ථාවක අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.
3. අදාළ පරිශ්‍රවලට ඇතුළු වීමේදී විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අංශ ඔබව පරීක්ෂාවට ලක් කරනු ඇත. ඒ සඳහා ඔබගේ සහයෝගය ලබා දිය යුතුය.
4. සම්මන්ත්‍රණ සඳහා පැමිණෙන බාහිර උපාධි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ ගේට්ටු අංක 02 (මහජන බැංකුව ඉදිරිපිට) වෙන් කර ඇත. (ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු විය නොහැක)
5. සම්මන්ත්‍රණ සඳහා නියමිත ශාලාවට පැමිණෙන විට ඔබට බාහිර විභාග ඒකකය විසින් ලබා දී ඇති ප්‍රවේශ පත්‍රය අනිවාර්යයෙන්ම රැගෙන ආ යුතුය. එසේ නොමැති කිසිදු විටක අදාල පරිශ්‍රයට ඇතුළු වීමට අවසර නොදෙන බව දන්වමි. ප්‍රවේශපත්‍රය හා ශිෂ්‍ය වාර්තා පොත පරීක්ෂා කිරීමෙන් පසුව ශාලාවට ඇතුළු කරනු ලැබේ.

6. අනන්‍යතාවය තහවුරු කරගත නොහැකි පරිදි මුහුණු ආවරණ හෝ හිස් වැසුම් පැළඳ අදාළ පරිශ්‍රවලට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ.
7. සම්මන්ත්‍රණය සඳහා සහභාගී වීම සඳහා දේශන ආරම්භ කරනු ලබන නියමිත වේලාවටම පැමිණිය යුතු බව දන්වමි. නියමිත වේලාවට නොපැමිණියහොත් ශාලාවට ඇතුළු කර නොගන්නා බව වැඩිදුරටත් දන්වමි.
8. සම්මන්ත්‍රණය සඳහා පැමිණෙන විට පොත්පත් හැර වෙනත් ගමන් මලු ආදිය රැගෙන නො ආ යුතුය.
9. බෑගයක් ගෙන ඒම අත්‍යවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විනිවිද පෙනෙන බෑගයක් පමණක් භාවිත කළ යුතුය.
10. අවශ්‍ය ආහාරපාන සියල්ල රැගෙන පැමිණීමෙන් අනවශ්‍ය ලෙස බැහැරට යාමෙන් සිදු වන අපහසුතා මගහරවා ගත හැකිය.
11. විශ්වවිද්‍යාලයේ වෙනත් පරිශ්‍ර වලට අනවශ්‍ය පරිදි ගමන් කිරීම සිදු නොකළ යුතුය.
12. විශ්වවිද්‍යාලයේ නීති රීති වලට අනුව කටයුතු කළ යුතුය.
13. ශිෂ්‍යයින්ට අයත් කිසිදු වාහනයක් අදාළ පරිශ්‍රවලට ඇතුල් කිරීමට ඉඩදෙනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය